**ශ්‍රී ලංකාව: පසුගාමී පියවරවලින් විශේෂඥයන් කැලඹීමට පත් වේ. වගවීම සහතික කිරීමට නැවතත් එක්සත් ජාතින්ගේ සුපරීක්ෂාව සහ ප්‍රයත්නයන් ඉල්ලා සිටී.**

ජිනිවා ( 2021 පෙබරවාරි 05) ප්‍රජාතන්ත්‍රීය ආයතන නැවත ගොඩ නැවීම පිළිබඳවත්, අතීත අපරාධ සඳහා වගවීම සහ වින්දිතයන් සඳහා යුක්තිය ලබා දීමටත් සහ ප්‍රජාවන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය සඳහා මෑත වසරවල දුෂ්කර අරගලයකින් අත් කර ගත් ප්‍රගතිය ආපසු හැරවීම නවතන මෙන් ශ්‍රී ලංකාවේ බලධාරීන්ගෙන් එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් විශේෂඥයෝ ඉල්ලා සිටියහ.

2015 සිට 2019 දක්වා කරන ලද නිල සංචාර 10කින් පසුව කළ නිර්දේශ 400ක් පමණ ප්‍රමාණයක් ගැන ආණ්ඩුව ගනු ලැබූ පියවර පිළිබඳ තක්සේරුවක් ස්වාධීන විශේෂඥයෝ අද ප්‍රකාශයට පත් කළහ. ඔවුහු රටේ මානව අයිතිවාසිකම් ස්වාධීනව අධීක්ෂණය කිරීම සහ අතීත අපරාධ පිළිබඳ වගවීම සහතික කිරීමේ ප්‍රයත්නයන් දිගටම පවත්වා ගන්නා ලෙසත් මානව අයිතිවාසිකම් කවුන්සලයෙන් ඉල්ලා සිටියහ.

''අපි සංහිඳියාව, වගවීම සහ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය පසුබෑමට ලක්වීමේ මතුවෙමින් පවතින ප්‍රවනතාවය, සිවිල් අවකාශය අඩු කිරීම සහ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ වැදගත් ආයතනික ආරක්ෂාවන් හානියට පත්වීම, මහ කොමසාරිස්වර්යගේ වාර්තාවෙන් මතු කරන ලද ගැටලු ගැන කැලඹීමට පත්වන්නෙමුයැයි වින්දිතයන් සහ සුළුතර ප්‍රජාවන්ට තර්ජනය කිරීමේ වර්ධනය වෙමින් පවතින ආණ්ඩුවේ බහුතරවාදි ප්‍රකාශ දක්වමින් ඔවුහු පැවසූහ.

2019 අප්‍රේල් පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරය සහ කොවිඩ්- 19 වසංගතය රටට ඉමහත් පීඩාවක් වුවද එම අර්බුදයන්ට ජාතික ආරක්ෂාව කේන්ද්‍ර කර ගත් ප්‍රතිචාර දැක්වීම සහ යුද අපරාධ චෝදනා ඉදිරිපත්ව ඇති සේවයේ යෙදී සිටි සහ දැනට සේවයේ යෙදී සිටින හමුදා නිලධාරීන් පත් කිරීම ඇතුළත්ව සිවිල් මහජන කාර්යන් හමුදාකරණයවීම කෙරේ වේගවත්ව යොමුවීමේ ප්‍රවනතාවය බිය ගන්වන්නේයැයි'' විශේෂඥයෝ පැවසූහ.

වැදගත් ආයතනික සංවරණ සහ තුලන ඉවත් කෙරෙන මෑතකදී සම්මත කළ 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සමග එවැනි ප්‍රතිචාර ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යයට අත්‍යවශ්‍ය වූ ආරක්ෂාවන් හානියට පත් කරමින් ශ්‍රී ලංකාවේ ආයතනික සහ අධිකරණ ඒකාග්‍රතාවය තර්ජනයට ලක්ව ඇතැයි ඔවුහු පැවසුහ.

ආණ්ඩුව සහශ්‍රක සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම තම න්‍යාය පත්‍රයේ ඉහළින්ම තබා ඇති නමුත් පාරදෘශ්‍ය, කාර්යක්ෂම, ඇතුළත් කර ගන්නා සහ වගවීමෙන් යුත් ආයතන නොමැතිව දරිද්‍රතාවය අවසන් කිරීම, අධ්‍යාපනය සහතික කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය වැනි අරමුණු සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගත නොහැකිය. ( තිරසර සංවර්ධන අරමුණු 16)

''අපගේ සංචාර තුළදී ශ්‍රී ලංකාවේ ගතිකත්වයෙන් යුත් සිවිල් සමාජයක් සඳහා අවකාශයක් විවෘත වෙමින් පවතින බව දක්නට ලැබුණ ද නැවත වරක් එය සංවෘත සහ අනාරක්ෂිත පවට පත්ව ඇතැයි'' ඔවුහු පවසති. ඒ සඳහා ජාතික ආරක්ෂා නීති ව්‍යවස්ථා

යොදා ගැනීම කණගාටුදායක බවද පෙන්වා දෙති. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදි සහ සාමකාමී සමාජයක හඬක් නොමැති අයගේ හඬට බලාධිකාරීන් සවන් දීම සහතික කිරීමට ක්‍රියාකාරී සහ ස්වාධීන සිවිල් සමාජයක් වැදගත්යැයි විශේෂඥයෝ පවසති.

කොවිඩ්- 19 වසංගත සමයේ දී සමාජ මාධ්‍ය හරහා අදහස් දැක්වූවන් සහ අනෙකුත් අය අත් අඩංගුවට ගැනිමට සහ රඳවා ගැනිමට හේතු වන ආකාරයට ප්‍රකාශ කිරීම, සංගම් පැවැත්විම සහ සාමකාමී රැස්විමේ අයිතිය කෙරේ සීමාවන් අසමාන ලෙස පනවා ඇතැයි ඔවුහු පැවසූහ. 2019 සිට මානව අයිතිවාසිකම් ක්‍රියාකාරීන්, ජනමාධ්‍යවේදීන්, නීතිඥයන් සහ වින්දිතයන්ගේ පවුල් ආරක්ෂක ආයතනවල වැඩි වූ සෝදිසියට, හිරිහැර කිරීම්වලට, ප්‍රශ්න කිරීම්වලට සහ තර්ජනයට ලක්ව ඇති බව නිතිපතා වාර්තා කර ඇත.''

සුළුතරයන් කෙරේ වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය දිරි ගැන්වෙන කතා වැළැක්වීමට බලධාරීන් අපොහොසත්විමෙන් වාර්ගික සහ ආගමික සුළුතර කොටස්වලට, එනම් දෙමළ සහ මුස්ලිම් අය වැඩියෙන් කොන් කිරීමට සහ ගර්හාවට ලක් කිරීම සිදුව ඇත. වැඩි දුරටත් සුළුතර ප්‍රජාවන්ගේ ආගමික සහ සංස්කෘතික චාරිත්‍රවලට එරෙහිව දැනට සිදු වන කොවිඩ්-19 මළ සිරුරු අනිවාර්යෙන් ආදාහනය කිරීම කණස්සල්ලට කාරණයක් වන අතර එය නතර කළ යුතුය.

''ශ්‍රී ලංකාවේ බලහත්කරයෙන් අතුරුදහන් කිරීම්වල පරිමානයක් සහ විශාලත්වයක් තිබුණ ද එම සිද්ධීන් විමර්ශනය කිරීමේ ප්‍රගතියක් අත් කර ගැනිමට, වින්දිතයන් සිටින තැන හෝ ඔවුන්ගේ ඉරණම හඳුනා ගැනිමට සහ ඒවා සිදු කළ අය වගවීමට පත් කිරීමට බලධාරීන් අපොහොසත්ව ඇතැ''යි ඔවුහු පැවසූහ.

ආණ්ඩුව මෙම ගැටලු ගැන වෙනස් පිවිසුමක් සංඥා කරත්ම වින්දිතයන් සහ ඔවුන්ගේ පවුල් තුළ දොම්නස සහ සැක සංකා වැඩි විය. අතුරුදහන් පුද්ගලයන් සඳහා වූ කාර්යාලය සහ හානිපූරණ කාර්යාලයේ අනාගතය ගැන අවිනිශ්චිත භාවයක් ඇති විය. එමෙන්ම සත්‍යය, යුක්තිය සහ වගවීම ඉල්ලා සිටින යුද වැන්දඹුවන් සහ අතුරුදහන් වුවන්ගේ ස්ත්‍රී ඥාතීන් මෙන්ම ඔවුන් වෙනුවෙන් පෙනි සිටින කාන්තා ක්‍රියාකාරීන් විශේෂිත අනතුරුවලට මුහුණ දෙති.

ත්‍රස්තවාදය වැළැක්විමේ පනත ඉවත් කිරීම ඇතුලුව වධ හිංසා පැමිණවීම තහනම් කිරීම පිළිබඳව ඉදිරිපත් කරන ලද නොයෙකුත් නිර්දේශ ආමන්ත්‍රණය කර නැතැයි විශේෂඥයෝ පැවසූහ. බන්ධනාගාර ප්‍රතිසංශෝධන ආණ්ඩුවේ න්‍යාය පත්‍රයේ පවතින බව පෙනෙන නමුත් මූලික හේතූන් ආමන්ත්‍රණය කර නැත. රඳවා ගැනීමේ තත්වයන් බොහෝවිට කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීමට සමානය. වධාත් පුළුල්ව අත් අඩංගුවේ දී මරණයට පත්වීම්, පැහැර ගෙන යෑම් සහ වධ හිංසා පැමිණවීම් පිළිබඳ චෝදනා ඉහළ යමින් පවතී.

මුක්තිය පිළිබඳ ප්‍රශ්නය ආමන්ත්‍රණය කිරීමට ආණ්ඩුව අපොහොසත්වීම බරපතළ කණසල්ලට හේතුවක්යැයි විශේෂඥයෝ පැවසූහ. 2009 පෙබරවාරි මස එක්සත් ජාතීන්ගේ වෙනත් විශේෂඥයින් 10 දෙනකුගේ කණ්ඩායමක් ''ශ්‍රී ලංකාව පුරාම මුක්තිය බාධාවකින් තොරව පැතිර යෑමට ඉඩ ලබා දී ඇත. කාර්යක්ෂම විමර්ශන සහ අභිචෝදනා ඉදිරිපත් කිරීමක් නොමැතිවීම හා බැඳුණු වින්දිතයන් සහ

සාක්ෂිකරුවන්ගෙන් පලි ගැනීමේ බිය මුක්තිය ලැබීමේ චක්‍රයකට හේතු වී ඇති අතර එය බිඳ දැමිය යුතුව ඇතැයි'' යන්න ඔවුහු ඉස්මතු කර දක්වති.

''වසර 12කට පසුවත් තත්වය එසේම පැවතීම අතිශයෙන් අධෛර්යට පත් කරවන්නක්යැ''යි විශේෂඥයෝ 2021 තම තක්සේරුවෙන් පෙන්වා දෙති. ''බොහෝ දුරට සම්බන්ධතාවයක් නැති සහ නිෂ්ඵල විමර්ශන කොමිසන් පත් කිරීමේ දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ උල්ලංඝනය කිරීම් අවංකවම ආමන්ත්‍රණය කිරීමේ ආණ්ඩුවේ අධිෂ්ඨානය ගැන අවිශ්වාසයක් ඇති කරවයි. දේශීය වගවීමේ කිසියම් පියවරක් ප්‍රගතියක් අත් කර ගනු ඇතැයි හෝ කිසියම් මට්ටමක විශ්වසනීයත්වයක් සාක්ෂා කර ගනු ඇතැයි බලාපොරොත්තුවක් නැත.

රටේ සංචාරයෙන් පසුව ඉදිරි පත්කරන ලද වාර්තාවල ඇති අදටත් වලංගු සහ ඉමහත් වැදගත් කමකින් යුත් අපේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ කඩිනම් අවශ්‍යතාවය නැවත අවධාරණය කිරීමට අදහස් කරන්නේ මෙවැනි පසුබිමක ය. ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය ඉහළ මට්ටමේ පරීක්ෂාවට ලක් කර තැබීමටත්, තවදුරටත් වගවීමේ පියවර ගැනීම ඇතුළත් රටේ වගවීම ඉදිරියට ගෙන යෑම සඳහා ගත හැකි සියලු විකල්පයන් සොයා බැලීමටත් අපි එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සලයෙන් සහ අන්තර්ජාතික ප්‍රජාවෙන් ඉල්ලා සිටිමු.''

එමනිසා මානව අයිතිවාසිකම් කවුන්සලය සහ සාමාජික රටවල් ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් තත්වය ස්වාධීනව අධීක්ෂණය, විශ්ලේෂණය සහ වාර්තා කිරීම ශක්තිමත් කළ යුතුයැයි ද, විමර්ශනය කිරීමෙන්, සංග්‍රහ කිරීමෙන් සහ තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් එක්සත් ජාතීන්ගේ විවිධ යාන්ත්‍රණ විසින් කරන ලද කාර්යන් මත පදනම් වන අපක්ෂපාත සහ ස්වාධීන අන්තර්ජාතික වගවීමේ යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුයැයි ද ඔවුහු පැවසූහ.

අවසානයි.

විශේෂඥයින්: ඇම්. ක්ලෙමන්ට් වූලේ (ටෝගෝ) සාමකාමී රැස්වීමේ සහ සංගම් පැවැත්වීමේ නිදහසට ඇති අයිතිය පිළිබඳ විශේෂ වාර්තාකරු, බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කණ්ඩායම: ටායි-උන්ග් බයික් මහතා (සභාපති- වාර්තාකරු) හෙන්රිකස් මික්කෙවිසියස් මහතා (උප සභාපති) අවුආ බැල්ඩේ මෙනෙවිය, බර්නාර්ඩ් ඩුහයිම් මහතා සහ ලුසියානෝ හසන් මහතා, හිතුවක්කාර රඳවා ගැනීම් පිළිබඳ එක්සත් ජාතීක්ගේ කණ්ඩායම: ලී ටූම් මෙනෙවිය (සභාපති- වාර්තාකරු), එලිනා ස්ටෙයින්ර්ටේ මෙනෙවිය (උප සභාපති) මිරියාම් එස්ට්‍රාඩා-කැස්ටිලෝ මෙනෙවිය, මුම්බා මලිලා මහතා, සියෝංග්-පිල් හොංග් මහතා, විනිශ්චයකරුවන් සහ නීතිඥයන්ගේ ස්වාධීනත්වය පිළිබඳ විශේෂ වාර්තාකරු, ඩියාගෝ ගාර්සියා-සයන් මහතා, සුළුතර ගැටලු පිළිබඳ විශේෂ වාර්තාකරු, ෆර්නන්ඩ් ඩි වැරන්නස් මහතා ආගම හෝ විශ්වාසයන් ගේ නිදහස පිළිබඳ විශේෂ වාර්තාකරු, අහ්මඩ් ෂාහිඩ් මහතා. ත්‍රස්තවාදයට විරුද්ධ වීමේ දී මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු, ෆියොනුවාලා නි අඕලාන් මෙනෙවිය, වධ හිංසා සහ වෙනත් කුරිරු,අමානුෂික හෝ අවමන් සහගත සැලකීම් හෝ දඬුවම් පිළිබඳ විශේෂ වාර්තාකරු, නිල්ස් මෙල්සර් මහතා, සත්‍යය,

**යුක්තිය, හානිපූරණය සහ නැවත සිදුනොවීම සහතික කිරීම පිළිබඳ විශේෂ වාර්තාකරු, ෆේබියන් සැල්වියෝලි මහතා.**

**විශේෂ වාර්තාකරුවන් මානව අයිතිවාසිකම් කවුන්සලයේ විශේෂ ක්‍රියා පටිපාටි යනුවෙන් හැඳින්වෙන ආයතනයේ කොටසකි. එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් පද්ධතියේ විශාලතම ස්වාධින විශේෂඥ ආයතනය වන විශේෂ ක්‍රියා පටිපාටි යනු ලොව සියලු ප්‍රදේශවල රටකට සුවිශේෂිත තත්වයන් හෝ තේමාගත ගැටලු ආමන්ත්‍රණය කරන කවුන්සලයේ ස්වාධීන තොරතුරු සෙවීමේ සහ අධීක්ෂණ යාන්ත්‍රණයේ පොදු නාමයයි. විශේෂ ක්‍රියා පටිපාටි විශේෂඥයන් සේවය කරන්නේ ස්වේච්ඡා පදනමකිනි. ඔවුන් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට අයත් නොවන අතර තම සේවය වෙනුවෙන් වැටුපක් ලබන්නේ නැත. කිසියම් ආණ්ඩුවකින් හෝ සංවිධානයකින් ස්වාධීන වන ඔවුහු පුද්ගල මට්ටමෙන් සේවය කරති.**

**තේමාගත විශේෂිත ක්‍රියා පටිපාටි, ගිවිසුම් ආයතන සහ නියත කාලීන පුනරීක්ෂණ ඇතුළත් එක්සත් ජාතින්ගේ මානව අයිතිවාසිකම් යාන්ත්‍රණවල රටකට විශේෂිත නිර්දේශ සහ/හෝ නිර්දේශ විශ්ව මානව අයිතිවාසිකම් දර්ශකය** *https://uhri.ohchr.org/en/ පිවිසීමෙන් දැකිය හැකිය.*

*අමතර තොරතුරු සහ මාධ්‍ය ඉල්ලීම් සඳහා ෆෙඩරිකා ඩොනටි මෙනෙවිය අමතන්න (fdonati@ohchr.org/+41 79 444 4506).*

*එක්සත් ජාතීන්ගේ වෙනත් ස්වාධීන විශේෂඥයන් සම්බන්ධයෙන් වූ මාධ්‍ය විමසීම් සඳහා කරුණාකර රෙනාටෝ ඩි සූසා (+41 22 928 9855 / rrosariodesouza@ohchr.org), ජෙරමි ලෝරන්ස් (+ 41 22 917 7578 / jlaurence@ohchr.org) අමතන්න.*

*එක්සත් ජාතින්ගේ ස්වාධීන මානව අයිතිවාසිකම් විශේෂඥයන් පිළිබඳ තොරතුරු සඳහා*

*Twitter@UN_SPExperts.*

*අප ජීවත් වන ලෝකය ගැන සැලකිලිමත් වන්නේ ද?*

*එසේ නම් අදම කෙනෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න.*

*#Standup4humanrights*

*සහ පහත වෙබ් පිටුවට පිවිසෙන්න*
*http://www.standup4humanrights.org*